මගේ අංකය :JSC/SPO/EB/2023(2025)

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ / අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023**

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 වෙනි දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 11.10 හා 15.4.1 සහ "ඕ" පරිශිෂ්ඨයෙහි දැක්වෙන කොන්දේසි හා විෂයය නිර්දේශ අනුව අධිකරණ පොත් බැඳුම්කරු III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල හා දෙමළ මාධ්‍යය වලින් කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III ශ්‍රේණියේ 2023.12.31 දිනට පෙර පත්වීම් ලද නිලධරයන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් වසර 05 ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තරය

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම පිළිබඳ අවබෝධය | පැය 02 | 100 | 40 |
| 02 | පොත් බැඳුම් කටයුතු පිළිබඳ අවබෝධය | පැය 01 | 100 | 40 |

03. විභාගය සඳහා විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම පිළිබඳ අවබෝධය | ආයතන සංග්‍රහය පිළිබඳ මූලික අවබෝධය සහ සාමාන්‍ය විනය සහ හැසිරීම පිළිබඳ අවබෝධය අපේක්ෂා කෙරේ. | පැය 02 |
| 02 | පොත් බැඳුම් කටයුතු පිළිබඳ අවබෝධය | නඩු වාර්තාවක හෝ අධිකරණ ලිපි ගොනුවක ලේඛන ගොනු කිරීමේ පිළිවෙල පිළිබඳ අවබෝධය අපේක්ෂා කෙරේ. | පැය 01 |

(අදාල සේවයට ඇතුළත් වීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට සහ/හෝ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් නිලධාරීන් විසින් ලිඛිත ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.)

04. මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න සහ/හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

05. පහත 6 වන ඡේදයේ කොන්දේසි වලට යටත්ව තමන් කැමති වන්නේ නම්, එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වල දී පෙනී සිටීමට නිලධරයන්ට හැකිය. එතකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට හතළිහක් (40%) නිලධරයන් විසින් ලබා ගත යුතු වේ.

06. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු 500/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු ය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම් කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම් කළ යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. මෙම විභාග ගාස්තු ''අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ''නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ අලවා එවිය යුතුය.

08. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමඟ **2025 අගෝස්තු 22** වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023" යනුවෙන් සඳහන් කළ යුතුය.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධරයන්ට දැන්වීමට කටයුතු කරන්න.

සටහන:- උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 15.4.1 වගන්තිය පහත පරිදි වේ.

**15.4.1 "නියමිත දිනට අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ, සේවයේ නියුතු සේවය ස්ථිර කර ඇති හෝ සේවය ස්ථිර කිරීම සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ සමත් විය යුතු අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වන ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් ඔවුන්ට පෞද්ගලික වන සේ නිදහස් කරනු ලැබේ."**

සී.එච්.ජී.ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

සී.එච්.ජී. ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්සන් කළේ / එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2025 ජුලි මස 16 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

**SPECIMEN APPLICATION FORM**

**Efficiency Bar Examination for Officers in Grade III of the Court Book Binders' Service of Sri Lanka - 2023**

---

01. Name:

 1:1 Name with initials Mr./Mrs./Miss: ..........................................................................................
 (In block capital letters)

 1:2 Full Name: ..........................................................................................................................
 (In block capital letters)

 1:3 Full Name: ..........................................................................................................................
 (In Sinhala/Tamil)

02. National Identity Card Number: ..............................................................................................

03. Address:

 3:1 Permanent Address: ..........................................................................................................
 (In block capital letters)

 3:2 Official Address: ...............................................................................................................
 (In block capital letters)

04. Contact Details

 4.1 Mobile No: ..............................................

05. Date of Birth: Date ___ Month ___ Year______

06. Personal File No: EA/PF/4/.................

07. Date of appointment to the post of Court Book Binder Grade III: ...............................

08. Medium in which you sit for the examination:

☐

(Denote with "S" for Sinhala, "T" for Tamil)

09. Please give details of the subjects and the years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I.<br>II. |

10. Subject / Subjects you are now offering to sit for:

(i) ……………………………………………

(ii) ……………………………………………

11. (i) The value of payment made as Examination fee: ……………………………………………

(ii) Name of the Bank and the Branch to which the payment was made: ……………………

(iii) Number and date of the receipt:……………………………………………………………………

| Affix the receipt here. |
|---|

I state that the particulars given are accurate and I am entitled to sit for the examination in the medium mentioned in the paragraph 8 above. I certify that I am appearing for the examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment I agree to be bound by the rules and regulations of the Secretary to Judicial Service Commission regarding conducting of the examination.

…………………………  ……………………………………………………

Date  Signature of the applicant

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss…………………………………………………………………………………………………… ……………………………………………who is a Grade III Book Binder is personally known to me and signed before me on ……………………………………………

……………………………………………

Signature

Date:………………………………………………

Name:……………………………………………..

Designation:…………………………………….

Address:…………………………………………

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate
02. The officer sits for this examination for the first time / has made the correct payment as examination Fee.
03. The applicant is eligible to sit for this examination

Designation: …………………………………

Date: ……………………………………………

……………………………………………………………………

Signature of the Head of the Department